බැංකු පනත් විධාන 2018 අංක 07 2018 ඔක්තෝබර් 12

# මෝටර් රථ වාහන සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ උප වගන්ති (3) හා සබැඳිව කියවිය යුතු 76(ඒ)(1) වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

මෝටර් රථ වාහන සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අවම කිරීම සහ විනිමය අනුපාතය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීමේ අරමුණින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත එම ආනයන සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් පහත විධානයන් නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 1. | බැංකු පනත යටතේ බල ගැන්වීම | බැංකු පද්ධතියේ අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා බැංකු පනතේ උප වගන්ති (3) හා සබැඳිව කියවිය යුතු 76(ඒ) (I) වගන්ති ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත, ඕනෑම බලපත්‍රලාභී විශේෂිත බැංකු කාණ්ඩයකට හෝ ඕනෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට එහි බැංකු/ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳව විධාන නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත. |
| 2. | ආනයන සඳහා පහසුකම් සැලසීමෙන් වැළකී සිටීම | උපලේඛන A හි සඳහන් මෝටර් රථ සහ උපලේඛන B හි සඳහන් අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ හැරුණුවිට ආනයනයන් සඳහා ණයවර ලිපි විවෘත කිරීමෙන් හෝ වෙනත් ආකාරයක ගෙවීම් කිරීමෙන් නැවත දැනුම් දෙන තුරු වැළකී සිටින ලෙස ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත දැනුම් දෙනු ලැබේ. |
| 3. | අවලංගු කිරීම | 2018 සැප්තැම්බර් මස 28 දිනැතිව නිකුත් කළ මෝටර් රථ ආනයනය සඳහා ණයවර ලිපිවලට එරෙහි ආන්තික අවශ්‍යතාවය පිළිබඳ ලිපිය මෙමගින් අවලංගු කෙරේ. |
| 4. | ක්‍රියාත්මක කිරීම | වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම විධානයන් ක්‍රියාත්මක කළ යුතු වේ. |

අත්සන් කළේ:
සී.ජේ.පී. සිරිවර්ධන
ප්‍රධාන විධායක නිලධාරී/
ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ
නියෝජ්‍ය අධිපති

මෙම විධානයේ උපලේඛන A හා B https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Direction_No_7_of_2018.pdf ඔස්සේ ලබා ගත හැක.